# ජනාධිපති කාර්යාලය
# ஜனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT



මගේ අංකය : PS/SD/GS/උපදෙස් පත්‍රිකා 2018-(4)
තිරසර සංවර්ධන අංශය
ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය

2018.09. 18

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් වෙත,

ප්‍රිය දිසාපතිතුමණි,

<u>ග්‍රාමශක්ති ජනතා සමිති මඟින් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම</u>

මේ සම්බන්ධයෙන් මාගේ අංක PS/SD/GS/උපදෙස් පත්‍රිකා 2018-(3) හා 2018.08.23 දිනැති ඔබ වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ.

- එම ලිපියෙහි අංක 02 යටතේ සඳහන් කරුණ පහත පරිදි සංශෝධනය වේ.
  ඒ අනුව සමිති සාමාජිකත්වය සහ සමාජිකයින්ගේ පවුල්වල සාමාජික සංඛ්‍යාව පදනම් කර ගනිමින් එක් අයකුට රු.8000 බැගින් වූ එක් වරක් පමණක් සමිති අරමුදලට ලබාදෙන ප්‍රතිපාදනය, එක් ග්‍රාම නිලධාරී වසමක් සඳහා වසර 04ක උපරිම කාලයකට යටත්ව, රුපියල් මිලියන 08කට සීමා වේ. එහි පළමු වාරිකය ලෙස 2018 වසර සඳහා රුපියල් මිලියනයක ප්‍රතිපාදන මේ වන විටත් ඔබ වෙත ලබාදී ඇත.

- මෙම සීමාවට යටත්ව එක් ග්‍රාම නිලධාරී වසමක් තුළ ග්‍රාමශක්ති සමිති කිපයක් වුවද ස්ථාපිත කළ හැක.

- ඉහත ලිපියෙහි අංක 17 යටතේ සඳහන් ප්‍රතිපාදන බෙදීයාමේ සීමාව පහත පරිදි සංශෝධනය කෙරේ.

  I. ජීවනෝපාය සංවර්ධනය (චක්‍රීය අරමුදල) 50%
  II. ධාරිතා සංවර්ධනය 30%
  III. යටිතල පහසුකම් සංවර්ධනය 20%

- දැනට සමිති සඳහා වෙන් කර ඇති රුපියල් මිලියනයක ප්‍රතිපාදනවලින් ග්‍රාමශක්ති ජනතා සමිතිය ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා මුදල් වැය කර ඇත්නම් එම ප්‍රමාණය අඩුකර ඉතිරි ප්‍රමාණය ඉහත සංශෝධනයට අනුව බෙදා සමිති ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතුවේ.

- පළමුව, ධාරිතා සංවර්ධනයට (30%) අදාළ ප්‍රතිපාදන පමණක් සමිති ගිණුමට නිදහස් කළ යුතුවේ.

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones 011 2354354, 011 4354354
ෆැක්ස් / தொலைநகல் / Fax 011 2340340
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail ps@presidentsoffice.lk

- එසේ නිදහස් කරන ප්‍රතිපාදනවලින් සමිතිවල නිලධාරී මණ්ඩලයට හා කමිටු සාමාජිකයින්ට පැවරෙණ වගකීම් කාර්යභාරය හා උප කමිටුවලට පැවරෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව පුළුල් දැනුවත් කිරීමක් සිදුකල යුතුවේ.

- මෙම දැනුවත් කිරීමේ කටයුතු සඳහා සම්පත්දායක සංචිතවල සේවා සහය අවශ්‍ය පරිදි ලබාගත හැකිය

- චක්‍රීය අරමුදල සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලබාදෙන ප්‍රතිපාදන නිදහස් කිරීමට අදාළ උපදෙස් පසුව ලබාදෙනු ඇත.

- යටිතල පහසුකම් සඳහා වෙන් වන ප්‍රතිපාදනවලින් 1%ක උපරිමයකට යටත්ව පරිපාලන වියදමක් දැරිය හැක.

- ග්‍රාමශක්ති ජනතා සමිතිය සඳහා වෙන් කරන ලද මුදල් වැය කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාමශක්ති ජනතා සමිතිය විසින් ගිවිසුම්ගත විය යුතු ආවරණ මූල්‍ය සම්පාදන ගිවිසුම ආකෘති අංක 01 හි දැක්වේ.

- ග්‍රාමශක්ති ජනතා සමිතිය විසින් බැංකු ගිණුමෙන් මුදල් නිදහස් කර ගැනීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ලිපිය ආකෘති අංක 02 හි දැක්වේ.

ධාරිතා සංවර්ධනයට අදාළ ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සමිතිවලට කඩිනමින් ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි. ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය ඔබ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

මෙයට සේවයට ලැදි,

චන්ද්‍රරත්න පල්ලේගම
ජනාධිපති අතිරේක ලේකම්
තිරසර සංවර්ධන අංශය

# ආවරණ මූල්‍ය සම්පාදන ගිවිසුම

මෙම ආවරණ මූල්‍ය සම්පාදන ගිවිසුම පහත දැක්වෙන පාර්ශ්වකරුවන් අතර 20............... මස.............. වන දින .................... දී ගිවිසගනු ලැබේ.

| | |
|---|---|
| ............................ (ප්‍රථම පාර්ශවය) නියෝජනය, | ........................... ග්‍රාමශක්ති ජනතා සමිති ද්විතිය පාර්ශවය) නියෝජනය, |
| ...................................... මයා/ මිය විසිනි (තනතුර හා ලිපිනය දක්වන්න) | 1. ........................................ මයා/මිය විසිනි. සභාපති (ලිපිනය දක්වන්න) |
| | 2. ........................................ මයා/මිය විසිනි. (තනතුර හා ලිපිනය දක්වන්න) |

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, ස්වකීය ජනතාවට තම ජීවන මාර්ග මෙන්ම ඔවුන්ගේ ජීවන තත්ත්වය ද දියුණු කර ගැනීම පිණිස හැකියාව සලසා දීමේ පරමාර්ථයෙන් යුක්තව, අතිගරු ජනාධිපතිතුමාගේ "තිරසර සංවර්ධන දැක්ම" යටතේ ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාවට නංවන අතර මෙම ව්‍යාපාරයේ දීර්ඝකාලීන ඉලක්කය වන්නේ වසර 2030වන විට දිළිඳුකමින් තොර ආර්ථික හා සමාජමය වශයෙන් සවිබල ගැන්වූ ප්‍රජාවක් සහිත ශ්‍රී ලංකික දේශයක් බිහි කිරීමය.

ඒ අනුව උක්ත ජනතා ව්‍යාපාරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීමේදී නිශ්චිතව මෙහි සඳහන් කර ඇති පාර්ශව දෙක අතර' මෙම ආවරණ මූල්‍ය සම්පාදන ගිවිසුම ගිවිසගනු ලබනවා ඇත.

**(ආ) ග්‍රාම නිලධාරී වසමේ විස්තරය :**

I. ගමේ නම : ................................................................................................

II. වසමේ නම : .................................. ප්‍රා.ලේ.කොට්ඨාශය ...............................

III. දිස්ත්‍රික්කය : .................................... පළාත : .......................................................

IV. ග්‍රාම නිලධාරී වසමේ හෝ වසම්වල වෙසෙන පවුල් සංඛ්‍යාව : ...................

ග්‍රාම නිලධාරී වසමේ හෝ වසම්වල මුළු ජනගහනය : ................................

V. ග්‍රාමශක්ති ජනතා සමිතියේ හෝ සමාගමේ නම සහ ලිපිනය: ........................................................
..................................................................................................................................

**(ඇ) මෙම ගිවිසුමේ විෂය පථය**

යම් ද්විතිය පාර්ශවයක් සියළුම නීතිරීති වලට අනුකූලව කටයුතු කරන්නේ නම්, එක් තැනැත්තෙකුට ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ රුපියල් 8000 ක උපරිමයක් දක්වා වූ ප්‍රදානයක් බැගින් සිව් වසරක කාලයක් මුළුල්ලේ හිමිකර ගැනීම සඳහා එකී ද්විතිය පාර්ශවය සුදුසුකම් ලබයි. මෙම සුදුසුකම් ලබන අරමුදල "ග්‍රාම සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අතර, මහ සභාව විසින් තීරණය කෙරෙන ග්‍රාමයේ ප්‍රමුඛතා මත රඳා පවතින්නා වූ පහත දැක්වෙන විෂය ක්ෂේත්‍ර 03 යටතේ එම අරමුදල් බෙදී යනු ඇත.

| විෂය | වෙන් කරනු ලබන දළ ප්‍රතිශතය |
|---|---|
| 1. ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ අරමුදල | 50% |
| 2. හැකියා වර්ධන අරමුදල | 30% |
| 3. ප්‍රජා හා සමාජ යටිතල පහසුකම් අරමුදල | 20% |

i. හැකියා වර්ධන අරමුදල හා ප්‍රජා හා සමාජ යටිතල පහසුකම් අරමුදල සඳහා අවශ්‍ය වන්නාවූ ආයෝජනවල සවිස්තරාත්මක ඇස්තමේන්තුද, ඊට සමාජික සමාජිකාවන්ගේ දායකත්වය හා ඒවා ක්‍රියාත්මක කිරීමේ කාල සටහන් පිළිබඳ විස්තරද, එහි භෞතික කාර්ය ඵලයන්හි කඩඉම් මෙන්ම ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ අරමුදල සඳහා විස්තර සහිත මාර්ගෝපදේශ, නීතිරීති හා යෝග්‍යතා දක්වන කාර්යයන්ද අඩංගු වන අත්පොත් ද්විතීය පාර්ශවය විසින් සකස් කරනු ලබනවා ඇත. මෙම යෝජනා සහ කාර්යයන් මහ සභාව විසින් (වසමේ මුළු පවුල් සංඛ්‍යාවෙන් බහුතරයකගේ සහභාගීත්වය සහිතව) අනුමත කරනු ලැබිය යුතු අතර, මෙම අරමුදල් පිළිබඳව හා අදාළ කාර්යයන් සම්බන්ධ සියලූම තොරතුරු මාසික පදනමක් මත මහ සභාව වෙත හෙළිදරව් කළ යුතුය.

ii. මෙම ආවරණ මූල්‍ය සම්පාදන ගිවිසුම මගින් ඉහතින් හඳුන්වා දෙනු ලැබ ඇති විෂයයන් සඳහා අරමුදල් සැපයීමේ හා ක්‍රියාත්මක කිරීමේ පොදු විධිවිධාන ආවරණය කරයි.

iii. ප්‍රථම පාර්ශවය, ජීවන මාර්ග වැඩිදියුණු කිරීමේ අරමුදල, හැකියා වර්ධන අරමුදල හා ප්‍රජා හා යටිතල පහසුකම් සංවර්ධන අරමුදල යටතේ ගැනෙන ව්‍යාපෘති මෙන්ම යෝග්‍යතාවන් දක්වන්නා වූ කාර්යයන්ද ඇගයුමට ලක්කොට ඊට නිසි අවසර ලබාදෙයි.

iv. මෙම ආවරණ මූල්‍ය සම්පාදන ගිවිසුමෙන් ගිවිසගනු ලැබ ඇති සියලූ කාර්යයන්, ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරයේ ප්‍රතිපත්ති, මූලධර්ම, නීතිරීති, ක්‍රියාපිළිවෙත් හා කාර්ය පටිපාටි අනුව සිදුවිය යුතුය. නිලධාරී මණ්ඩලයේ කිසියම් සාමාජිකයෙකු, කමිටු සමාජිකයකු හෝ ප්‍රජා සමාජිකයකු යන කවරෙකු හෝ විසින් අරමුදල් අයථා පරිදි පරිහරණය කරනු ලැබුවහොත් අවභාවිත කර ඇත්නම් සිදු කරනු ලබන පරීක්ෂණයකින් අනතුරුව සියලූම ග්‍රාමශක්ති අරමුදල් අවලංගු වන අතර පවතින සමිති/සමාගම් නීතිය යටතේ ඒ සඳහා නීති මගින් කටයුතු කිරීමට එකඟතාව ලබා දේ.

.........................................
අත්සන
ප්‍රථම පාර්ශ්වයේ නියෝජිත.

.........................................
අත්සන
ද්විතීය පාර්ශ්වයේ I වන නියෝජිත *

.........................................
අත්සන
ද්විතීය පාර්ශ්වයේ II වන නියෝජිත *

සාක්ෂි : 1. ....................................
2. ....................................

සාක්ෂි : 1. ....................................
2. ....................................

*යටතේ පිරිසෙයින් ද්විතීය පාර්ශ්වයේ එක් නියෝජිතයෙකු හෝ කාන්තාවක විය යුතුය.

## ග්‍රාමශක්ති ජනතා සමිතිය මගින් බැංකු ගිණුමෙන් මුදල් නිදහස් කර ගැනීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍රය

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ..............................................................................................
- ග්‍රාමශක්ති ජනතා සමිතියේ නම : ..............................................................................................

අරමුදල් ඉල්ලුම් කිරීම :

.................................................. බැංකුව
.................................................. ශාඛාව

කළමණාකරු,

ඉහත නම් සඳහන් අපගේ ග්‍රාමශක්ති ජනතා සමිතියේ මහසභාවේ එකඟතාවය පරිදි අප විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත .................................................................................................. ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය/ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය/ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් විධිමත් පරිදි සකස් කර ඇති ඇස්තමේන්තුව සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහ දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන රු. .................................................................................................. (ඉලක්කමෙන් සහ අකුරෙන්)ක මුදල අපගේ ග්‍රාමශක්ති ජනතා සමිතියේ නමින් ගිණුම ස්ථාපිත කර ඇති ඔබ බැංකුවේ ගිණුම් අංක .................................. වෙත බැර කර ඇති මුදල් වලින්......................... දින ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

| .................................. | .................................. | .................................. |
|---|---|---|
| සභාපති (නිලමුද්‍රාව) | ලේකම් (නිලමුද්‍රාව) | භාණ්ඩාගාරික (නිලමුද්‍රාව) |

වයඹහාර සංවර්ධන නිලධාරීගේ නිර්දේශය :

උක්ත ව්‍යාපෘතිය ග්‍රාමශක්ති ජනතා සමිතිය විසින් සකස් කරන ලද ග්‍රාමීය සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතාගත කර ඇති ව්‍යාපෘතියක් බවත්, එය ශක්‍යතාවයෙන් යුක්ත ව්‍යාපෘතියක් බවත්, මා විසින් සිදු කරන ලද මඟපෙන්වීම්වලට අනුව විධිමත් පරිදි ඇස්තමේන්තු සකස් කර අදාළ නිර්දේශයන් සහ අනුමැතියන් ලබා ගෙන ඇති බවත් කාරුණිකව දන්වමි. ව්‍යාපෘතිය සඳහා අරමුදල් නිදහස් කිරීම නිර්දේශ කරනු ලබන අතර, ව්‍යාපෘතිය අවසන් වන තුරු අඛණ්ඩව පසුවිපරම් කරමින්, ව්‍යාපෘතිය නියාමනය කරමින් අදාළ අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කරනු ලබන බවත් කාරුණිකව දන්වමි.

| .................................................. | .................................................. |
|---|---|
| දිනය | අත්සන (නිලමුද්‍රාව) |

සහකාර අධ්‍යක්‍ෂ (ක්‍රමසම්පාදන) නිර්දේශය :

උක්ත ව්‍යාපෘතිය මා විසින් පෞද්ගලිකවම අධ්‍යනය කරන ලදී. එය ක්‍රියාත්මක කළ යුතු ශක්‍යතාවයෙන් යුක්ත ව්‍යාපෘතියක් බවද සහතික කරමි. එම නිසා අරමුදල් නිදහස් කිරීම නිර්දේශ කරනු ලබන අතර, ව්‍යාපෘතිය අවසන් වන තුරු අඛණ්ඩව පසුවිපරම් කරමින්, ව්‍යාපෘතිය නියාමනය කරමින් අදාළ අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කරනු ලබන බවත් කාරුණිකව දන්වමි.

| .................................................. | .................................................. |
|---|---|
| දිනය | අත්සන (නිලමුද්‍රාව) |

ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය :

අරමුදල් නිදහස් කිරීම අනුමත කරමි/ නොකරමි.

| .................................................. | .................................................. |
|---|---|
| දිනය | අත්සන (නිලමුද්‍රාව) |